38

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

ආර්ථික විද්‍යාව

**ECON 4165.02 – පරිසර ආර්ථිකවිද්‍යාව**

ශාස්ත්‍රවේදී අවසන් වසර ප්‍රථම අර්ධවාර්ෂික පරීක්ෂණය - 2018 අගෝස්තු/සැප්තැම්බර්

---

කාලයඃ පැය තුනයි (03) යි.

එක් කොටසකින් එක් ප්‍රශ්නයක්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

අවසන් ඇගයුමෙන් 75% ක් මෙම පත්‍රයට හිමි වේ.

---

## I කොටස

01. i. නූතන සාර්ව ආර්ථික චක්‍රීය ප්‍රවාහ ආකෘතිය තුළ පරිසරයේ කාර්යභාරය සැකෙවින් සාකච්ඡා කරන්න.

(ලකුණු 07)

ii. ආර්ථිකවිද්‍යා උප විෂය ක්ෂේත්‍රයක් ලෙස පරිසර ආර්ථිකවිද්‍යාව විෂයයේ වැදගත්කම හා නූතන ආර්ථිකයන්ගේ ක්‍රියාකාරිත්වය විශ්ලේෂණය කිරීමේ දී එහි කාර්යභාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

02. i. "විවෘත ප්‍රවේශ සම්පතක් (open access property) සෑම විටම ප්‍රජාව සතු දේපලක් (communal property) බවට පත්කර කාර්යක්ෂම පරිහරණයක් සඳහා යොමුකල හැකිය." විවේචනාත්මකව විමසන්න.

(ලකුණු 06)

ii. පෞද්ගලික දේපල හිමිකම (private property), විවෘත ප්‍රවේශ (open access) තත්ත්වයට සාපේක්ෂව සෑම විටම වෙළෙඳපොලක් ආර්ථික කාර්යක්ෂමතාව කරා මෙහෙයවීමට සමත් වේ. නියමාකාර ලෙස නිර්වචනය වූ පෞද්ගලික දේපලක මූලික ලක්ෂණ ආශ්‍රයෙන් විමසන්න.

(ලකුණු 09)

03. i. ක්යොතෝ සම්මුතියේ (Kyoto Protocol) කාබන් වෙළෙඳාම (carbon trading) වැඩපිළිවෙලෙහි න්‍යායාත්මක පදනම සැකෙවින් පහදන්න.

(ලකුණු 07)

ii. පරිසර ආරක්ෂණය සඳහා ආර්ථික දිරිදීම් (economic incentives) වශයෙන් මිල සලාකන උපායමාර්ග (price rationing strategies) ක්‍රියාත්මක කරන්නේ කෙසේදැයි පහදන්න.

(ලකුණු 08)

04. i. "බාහිරතා" (externalities) සහ "බාහිරතා අභ්‍යන්තරීකරණය" (internalizing externalities) යන්නෙන් කුමක් අදහස් වේද? විවිධ බාහිරතා වර්ග සඳහා උදාහරණ සපයන්න.

(ලකුණු 06)

ii. "ශුන්‍ය පරිසර දූෂණ මට්ටම යනු ආර්ථිකය කාර්යක්ෂමතා ප්‍රමිතියකි (efficiency standard)." එකඟ වන්නේ ද? සාකච්ඡා කරන්න.

(ලකුණු 09)

## II කොටස

05. i. ස්වාභාවික සම්පත් වර්ගීකරණයක් සිදුකල හැක්කේ කෙසේ ද? උදාහරණ සහිතව දක්වන්න.

(ලකුණු 06)

ii. ප්‍රතිස්ථාපනය කල නොහැකි සම්පතක ප්‍රශස්ත භාවිතය පිළිබඳ කොන්දේසි හොටෙලින්ගේ න්‍යාය (Hotelling's rule) ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 09)

06. i. "ඉඩම් සඳහා ආර්ථික බදු කුලිය (economic rent) අතිරික්ත වටිනාකමක් (surplus value) ලෙස ජනනය වේ." ඉඩම් පරිහරණය පිළිබඳ රිකාඩෝ ආදර්ශය (Ricardo model) ආශ්‍රයෙන් පහදන්න.

(ලකුණු 07)

ii. "නූතන ආර්ථිකයන් තුළ ඉඩම් සම්පත් පරිහරණය විග්‍රහ කිරීමේ දී රිකාඩෝ ආදර්ශය (Ricardo model) ට වඩා වොන් තුනෙන් ආදර්ශය (Von Thunen model) ට වැඩි වැදගත්කමක් හිමිවේ." සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

07. පහත මාතෘකා අතුරින් තුනක් (03) කෙටියෙන් සාකච්ඡා කරන්න.

i. පොදු භාණ්ඩ (public goods) හා වෙළෙඳපොල අසමත්කම් (market failures)

ii. තොරතුරු වල අපූර්ණතා (information asymmetry) හා වෙළෙඳපොල අසමත්කම්

iii. පරිසර ආරක්ෂණය උදෙසා වන ආර්ථික දිරිදීම් (economic incentives) වල ඇගයුම් උපමානයන් (evaluative criteria)

iv. මත්ස්‍ය සම්පත් ආශ්‍රිත ජෛව චිරස්ථායි අස්වැන්න (biologically sustainable yield)

v. ආර්ථික කාර්යක්ෂමතාවය (economic efficiency) හා සමාජ සුබසාධනය (social welfare)

(ලකුණු 5×3)

****